ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව
இலங்கை மனித உரிமைகள் ஆணைக்குழு
HUMAN RIGHTS COMMISSION OF SRI LANKA


| | | |
|---|---|---|
| මගේ අංකය<br>எனது இல.<br>My No. | ඔබේ අංකය<br>உமது இல.<br>Your No. | දිනය<br>திகதி<br>Date 2020/10/21 |

සි.ඩී.වික්‍රමරත්න මහතා

පොලිස්පති (වැ.බ),

පොලිස් මූලස්ථානය,

කොළඹ 01.

<u>පොලිස් අත්අඩංගුවේ සිටි සැකකරුවන්ගේ මිය යාම් සම්බන්ධවයි.</u>

ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව විසින් පොලිස් අත්අඩංගුවේ සිටි සැකකරුවන් මිය යාම් වල වැඩිවීමක් පසුගිය කාල වකවානුව තුලදි නිරීක්ෂණය කරන ලදි.

අප කොමිෂන් සභාව නිරීක්ෂණය කල ආකාරයට 2020 ජූනි මස සිට මේ දක්වා පොලිස් අත්අඩංගුවේදි මිය යාම් 8 ක් වාර්තා වී ඇති අතර. 2020.10.20 වන දින සිදු වූ රැඳවුම් නියෝග මත රදවා සිටි සමරසිංහ ආරච්චිලාගේ මධූෂ් ලක්ෂිතගේ මිය යාමද ඒට ඇතුලත් වේ.

1996 අංක 21 දරණ ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභා පනතේ 11 (අ) වගන්ති ප්‍රකාරව මූලික අයිතිවාසිකම් පිලිබඳ යම් උල්ලංඝණය කිරීමක් හෝ අත්‍යාසන්න උල්ලංඝණය කිරීමක් පිලිබඳ විමර්ශනය කිරීමත්, 11 (ඇ) වගන්තියේ බලතල ප්‍රකාරව අධිකරණමය අඥාවක් මගින් හෝ අන්‍යාකාරයකින් හෝ රදවා ගෙන සිටින තැනැත්තන්ගේ සුභසිද්ධිය සඳහා අවශ්‍ය විය හැකි නිර්දේශ ඉදිරිපත් කිරීමට ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව කටයුතු කරනු ලබයි.

ඒ අනුව ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාවට, කොළඹ අපරාධ කොට්ඨාශය වෙත රැඳවුම් ස්ථානය වෙනස් කල සමරසිංහ ආරච්චිලාගේ මධූෂ් ලක්ෂිත යන අයට යම් ජීවිත අනතුරක් වීමට හැකියාවක් ඇති බවට 2020.10.18 දින ලද පැමිණිල්ලට අනුව එම රැඳවියාගේ ජීවිත ආරක්ෂාව සම්බන්ධව සුදුසු වැඩ පිලිවෙලක් ගත යුතු බව දක්වමින් 2020.10.19 දිනැතිව කොළඹ අපරාධ කොට්ඨාශය, පොලිස්පති හා පොලිස් කොමිෂන් සභාව වෙත ෆැක්ස් පණිවිඩ මගින් දන්වා තිබියදි විමර්ශන කටයුත්තකදි එම රැඳවියා මිය යාම පිලිබඳ ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව තම අවධානය යොමු කර ඇත. (ඔබගේ පහසුව සඳහා එම ලිපියේ පිටපතක් මේ සමග අමුණා ඇත.) එසේම එසැබැදිව හා පොලිස් අත්අඩංගුවේදි සිදුවන මිය යාම් පිලිබඳ මේ වන විට පරික්ෂණ ආරම්භ කර ඇත. එම එක් පරික්ෂණයක් සඳහා 2020.10.21 දින පෙරවරු 11.30 ට කොළඹ අපරාධ කොට්ඨාශයේ අධ්‍යක්ෂක හා ස්ථානාධිපති කැඳවා තිබුණද කිසිදු හේතු දැක්වීමකින් තොරව සහභාගි වී නැත. ඒ අනුව එම නිලධාරින්ගේ ක්‍රියාකලාපය ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභා පනතේ 21 වගන්තිය යටතේ ගැනෙන කාරුණක් බව ඔබගේ අවධානයට ලක් කිරීමට කැමැත්තෙමි.

එබැවින් එම නිලධාරින් සම්බන්ධව නිසි පියවර ගෙන කොමිෂන් සභාව දැනුවත් කරන්නේ නම් මැනවි.


ප්‍රධාන කාර්යාලය / பிரதான அலுவலகம் / Head Office: 14, ආර්. ඒ. ද මෙල් මාවත, කොළඹ - 04. / 14, ஆர்.ஏ.த. மெல் மாவத்தை, கொழும்பு - 04. / 14, R. A. De Mel Mawatha, Colombo - 04.
සභාපති / தவிசாளர் / Chairperson: 011-2505451
ෆැක්ස් / தொலைநகல் / Fax: 011-2505541 / 74
ඊමේල් / மின்னஞ்சல் / E-mail: sechrc@gmail.com
දුරකථන / தொலைபேசி / Telephone: 94-11-2505580 / 81 / 82
ලේකම් / செயலாளர் / Secretary: 011-2505521
ක්ෂණික / துரித அழைப்பு / Hotline: 1996
වෙබ් / இணையம் / Web: www.hrcsl.lk

එසේම 2020.08.27 දිනැතිව ජාතික පොලිස් කොමිෂන් සභාව හමුවේ පොලිස්පති, මානව හිමිකම් කොමිෂන් සභාව සමඟ පැවැති සාකච්ජාවේ දී පොලිස් අත්අඩංගුවේදි සිදු වූ මිය යාම පිලිබඳ සාකච්ජාවට බඳුන් වූ බවද ඔබගේ අවධානයට යොමු කරමි.

මෙවැනි සිදුවීම් දිගින් දිගටම සිදුවීම තුලින් රට තුල නීතියේ ආධිපත්‍යය පිලිබඳ බරපතල ගැටලුකාරි තත්වයක් ගොඩ නැගෙන බව ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාවේ විශ්වාසයයි.

එබැවින් මෙම සිදුවීම පිලිබඳ ඔබගේ අවධානය යොමුකර නිසි විමර්ශන සිදු කිරීමක් කර ඉදිරියට මෙවැනි සිදුවීම් ඇතිවීම වැලැක්වීමට අවශ්‍ය කටයුතු ගන්නා ලෙසට ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව නිර්දේශ කර සිටියි. එසේම මේ සම්බන්ධව ඔබගේ කරුණු ඇතුලත් වාර්තාවක් 2020.10.26 දිනට පෙර ලැබීමට සලස්වන්නේ නම් මැනවි.

**Commissioner**
Human Rights Commission of Sri Lanka
No. 14, R.A. De Mel Mawatha,
Colombo 04.

රමණි මුත්තේට්ටුවගම
කොමසාරිස්
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව.

හ/

පිටපත : සභාපති, පොලිස් කොමිෂන් සභාව